# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office - මුදල් / நிதி / Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax - මුදල් / நிதி / Finance: (+94)-11-2449823
කාර්යාලය / அலுவலகம் / Office - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් / பெக்ஸ் / Fax - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No. BD/CBP/4/1/12 - 2019

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2019.01. 25

අයවැය චක්‍රලේඛ අංක 01/2019

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**2018 වර්ෂය සඳහා විසර්ජන ගිණුම් ඇතුළු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීම**

2018 වර්ෂය සඳහා සම්මත වූ 2017 අංක 30 දරන විසර්ජන පනතෙහි සඳහන් වූ අමාත්‍යාංශ ව්‍යුහය ඉන්පසුව 2018 වර්ෂය තුළදී අවස්ථා කිහිපයකදී විවිධ වෙනස්වීම් වලට භාජනයවී ඇති අතර 2018 වර්ෂයේ පැවති ඇතැම් වැය ශීර්ෂ මේ වනවිට සම්පූර්ණයෙන්ම අහෝසි වී අදාල කාර්යයන් වෙනත් වැය ශීර්ෂයන් වෙත පැවරී ඇත. ඒ අනුව අහෝසි වී ගිය අමාත්‍යාංශ වලට අදාළ විසර්ජන ගිණුම් ඇතුළු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මහා භාණ්ඩාගාරයේ උපදෙස් අනුව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. මහා භාණ්ඩාගාරය විසින් 2018 ඇස්තමේන්තුවේ පැවති වැය ශීර්ෂවලට අදාළ විෂයයන් දැනට බෙදීගොස් ඇති අමාත්‍යාංශ පිළිබඳව අධ්‍යයනය කර, අහෝසි වී ගිය වැය ශීර්ෂවල ප්‍රතිපාදන සම්බන්ධයෙන් අවසන් ගිණුම් සකස් කිරීම සඳහා වඩාත්ම සුදුසු වන නව අමාත්‍යාංශය කුමක්ද යන්න තීරණය කරන ලදී. ඒ අනුව, මේ සමග දක්වා ඇති ඇමුණුම 1 හි වම් පසින් දැක්වෙන නව අමාත්‍යාංශයේ ලේකම් වෙත එහි දකුණු පසින් දැක්වෙන්නාවූ 2018 වර්ෂයේ පැවති අමාත්‍යාංශවලට අදාළ වැය ශීර්ෂවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ වගකීම පවරනු ලැබේ.

02. මේ අකාරයට පෙර පැවති වැය ශීර්ෂ සඳහා වන වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීම අදාළ **විෂයය පැවරුණු නව අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිගේ වගකීම වේ.**

03. ඒ අනුව, මෙම චක්‍රලේඛයේ උපදෙස් හා 2018 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීම පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති අංක 267/2018 හා 2018.11.21 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කරමින් 2018 වර්ෂය සඳහාවූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතුවේ.

මේ සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සලකමි.

ඒ. ආර්. දේශප්‍රිය
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්

| නව වැය ශීර්ෂ අංකය | 2019.01.22 වන විට පවතින අමාත්‍යාංශයේ නම | පැවති වැය ශීර්ෂ අංකය | 2018 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වෙන්කරන ලද වැය ශීර්ෂ |
|---|---|---|---|
| 101 | බුද්ධශාසන හා වයඹ සංවර්ධන | 101 | බුද්ධ ශාසන |
| 102 | මුදල් සහ ජනමාධ්‍ය | 102 | මුදල් හා ජනමාධ්‍ය |
| 103 | ආරක්ෂක | 103<br>192 | ආරක්ෂක<br>නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන |
| 104 | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තිය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු | 104<br>145<br>147<br>148<br>197 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු<br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් හා හින්දු ආගමික කටයුතු<br>ප්‍රාදේශීය සංවර්ධන<br>සංවර්ධන කාර්යභාර<br>නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු |
| 108 | තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු | 108 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු |
| 110 | අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ | 110 | අධිකරණ |
| 111 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය | 111 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය |
| 112 | විදේශ කටයුතු | 112 | විදේශ කටයුතු |
| 114 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා | 114 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා |
| 117 | මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන | 117<br>150 | උසස් අධ්‍යාපන හා මහාමාර්ග<br>ඛණිජතෙල් සම්පත් සංවර්ධන |
| 118 | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන | 118<br>151<br>154<br>198 | කෘෂිකර්ම<br>ධිවර හා ජලජ සම්පත් සංවර්ධන<br>ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ<br>වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ |
| 119 | විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන | 119 | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති |
| 120 | කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන | 120 | කාන්තා හා ළමා කටයුතු |
| 122 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ | 122 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ |
| 123 | නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු | 123<br>163 | නිවාස හා ඉදිකිරීම්<br>අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු |
| 126 | අධ්‍යාපන | 126 | අධ්‍යාපන |
| 130 | රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ | 130<br>106 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ<br>ආපදා කළමනාකරණ |
| 135 | වැවිලි කර්මාන්ත | 135 | වැවිලි කර්මාන්ත |
| 140 | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන | 140 | කඳුරට නවගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන |
| 149 | කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන | 149 | කර්මාන්ත හා වාණිජ |

| නව වැය ශීර්ෂ අංකය | 2019.01.22 වන විට පවතින අමාත්‍යාංශයේ නම | පැවති වැය ශීර්ෂ අංකය | 2018 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වෙන්කරන ලද වැය ශීර්ෂ |
|---|---|---|---|
| 155 | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන | 155 | පළාත් සභා හා පළාත් පාලන |
| | | 121 | ස්වදේශ කටයුතු |
| 157 | ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු | 157 | ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා |
| | | 165 | ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන |
| 158 | රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන | 158 | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන |
| 159 | සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු | 159 | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු |
| | | 161 | තිරසර සංවර්ධන හා වනජීවී |
| 160 | මහවැලි සංවර්ධන හා පරිසර | 160 | මහවැලි සංවර්ධන හා පරිසර |
| 162 | මහානගර හා බස්නාහිර සංවර්ධන | 162 | මහානගර හා බස්නාහිර සංවර්ධන |
| 166 | නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන | 166 | නගර සැලසුම් හා ජල සම්පාදන |
| 176 | වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන | 176 | වරාය හා නාවික කටයුතු |
| | ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් | 124 | සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ |
| | | 199 | ප්‍රාථමික කර්මාන්ත |
| 194 | විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා | 136 | ක්‍රීඩා |
| | | 182 | විදේශ රැකියා |
| 195 | සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ | 195 | සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ |
| 52 | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය මණ්ඩලයේ සමාජික නොවන අමාත්‍යාංශය | 196 | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ |
| | | 167 | විශේෂ කාර්යයභාර |
| 53 | පොදු සැපයීම් සහ ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍ය මණ්ඩලයේ සමාජික නොවන අමාත්‍යාංශය | | |
| 51 | ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය මණ්ඩලයේ සමාජික නොවන අමාත්‍යාංශය | 194 | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් |
| | කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය මණ්ඩලයේ සමාජික නොවන අමාත්‍යාංශය | 193 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන |